# නිවේදනය යි!

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) වෙත:

වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාර රට තුළ භාවිතා වන සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අනුමත ලේබලයකින් සහ ප්‍රමිතියෙන් යුක්තව ලියාපදිංචි වී තිබිය යුතුය.

එහෙත්, දේශීය සහ විදේශීය නිෂ්පාදිත පහත නම් සඳහන් නීතිවිරෝධී නිෂ්පාදන දිවයිනේ විවිධ ප්‍රදේශවල බෙදා හැරීම හා අලෙවි කිරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත මූලික තොරතුරු අනාවරණය වී ඇත (ඇමුණුම 1-9). අංක 2226/48 සහ 2021.05.06 දින අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළිබෝධනාශක ආනයනය කිරීම සීමා කිරීම සමඟ හරිත කෘෂිකර්මාන්තයක් ඇති කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩ නැඟීමේ අරමුණු සැළකිල්ලට ගත්විට මෙවැනි අධික අවදානම් සහ නීති විරෝධී පළිබෝධනාශක නීතිවිරෝධී මාර්ගවලින් වෙළෙඳපොලට පැමිණීම සහ ගොවි ප්‍රජාව අතරට පත්වීම දැඩි අවධානයට ගත යුතු කාරණයක් බව සළකමි.

1. MONOPHOS (Monocrotophos 36% SL)
2. WINTON (Edimaidnebulf 20% WG)
3. CARBOFURAN 3% GR
4. STARPRIME (Acephate 75% SP)
5. HAMOI (Thiophanate-methyl 50% + Thiram 30% WP)
6. SPEEDCAP (Thiram 75% DS)
7. SPEED-99 (Acetamiprid 20% SP)
8. SANJU CHEMICAL
9. SEARLES COPPER OXYCHLORIDE (Copper 50% WP)

එබැවින්, මෙම නීතිවිරෝධී නිෂ්පාදන පිළිබඳව පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ සියළුම බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2021 සැප්තැම්බර් මස 24 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 Mobile 0772363824




ඇමුණුම -1 : MONOPHOS (Monocrotophos 36% SL) යන නමින් සඳහන් නීති විරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -2 : WINTON (Edimaidnebulf 20% WG) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -3 : Carbofuran 3% GR යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -4 : STARPRIME (Acephate 75% SP) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -5 : HAMOI (Thiophanate-methyl 50% + Thiram 30% WP) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -6 : SEEDCAP (Thiram 75% DS) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -7 : SPEED-99 (Acetamiprid 20% SP) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය




ඇමුණුම -8 : SANJU CHEMICAL යන නමින් සඳහන් නීතිවිරෝධී දේශීය නිෂ්පාදනය




ඇමුණුම -9 : SEARLES COPPER OXYCHLORIDE (50% Copper WP) යන නමින් සඳහන් නීතිවිරෝධී විදේශීය නිෂ්පාදනය